පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂිණියම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂිණිය
මැදමහනුවර

කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,

මධ්‍යම පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා අංක - 492

ආයතනයේ නම - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා 492 පිටු අංක	වර්තමානයේ හඳුනාගෙන තිබූ අඩුපාඩු	දුර්වලතා නිවැරදි කිරීමට ආයතනය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග/ වර්තමාන තත්ත්වය
167	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂය අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර ඊට අනුකූල වන පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් ක්‍රියාත්මක කළ බව කාරුණිකව සඳහන් කර සිටිමි. එසේම 2024,2025 සහ 2026 වර්ෂ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කර ක්‍රියාත්මක කළ බව වැඩිදුරටත් කාරුණිකව සඳහන් කර සිටිමි.
167	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්නකයේ නොමැත.	අංක CP PE 1956 දරණ කැබ් රථයේ අයිතිය මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින බවත්, අංක CP GL 2986 සහ CP PE 8791 දරණ කැබ් රථවල අයිතිය ප්‍රධාන ලේකම් සතුව පවතින අතර පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. මෙම දෙපාර්තමේන්තුවේවන්කම් වලටද ඇතුළත් කර ඇති බවද කාරුණිකව සඳහන් කරමි.
167	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ අදාළ ලොග් පොත් යාවත්කාලීන කර ඇති බව කාරුණිකව සඳහන් කර සිටිමි. වර්තමානයේදී සියළු වාහන සඳහා ලොග් සටහන් පොත් යාවත්කාලීනව නිවැරදි කරන බව වැඩිදුරටත් කාරුණිකව සඳහන් කර සිටිමි.
167	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 14 ක් ඇතුළත නිරවුල් කර ලෙස මෙම දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිව සඳහන් කරමි. ඒ අනුව වර්තමානය වන විට ලබා දෙන තත්ත්කාර්ය අතුරු අග්‍රිමයන් අදාල කාර්යයන් නිම වී දින 14 ක් ඇතුළත පියවාගෙන ඇති බව වැඩිදුරටත් කාරුණිකව සඳහන් කර සිටිමි.
167	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවත්න මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	මෙම දෙපාර්තමේන්තුවේ 2024 හා 2025 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශයන්ට අදාලව තත්ත්වාගණනය කළ විගණන මතයන් හිමිව ඇති බව කාරුණිකව සඳහන් කරමි.

2024/06/23

මනෝහා විජේතුංග
පළාත් ඉඩම් කොමසාරිස්
පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මාලාවේ අංකය – 492

ආයතනයේ නම – මධ්‍යම පළාත් ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු සඳහා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
167	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අතරට මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් අයත් වේ. ඒ අනුව මෙම ශේෂයන් පිළිබඳ ගෙන ඇති ක්‍රියා මාර්ග හා වර්තමාන තත්වය පහත පරිදි සඳහන් කල හැක. <u>මිය ගිය නිලධාරීන්</u> 1.එච්.ජී.විජේරත්න මයා - රු.114,500.00 සම්පූර්ණයෙන් අය වී අවසන්ය <u>විශ්‍රාම ගිය නිලධාරීන්</u> 1.ඩබ්.එම්.පත්මසිරි මයා - රු.2,500.00 - සම්පූර්ණයෙන් අය වී අවසන්ය 2.ඒ.ජී.එන්.ජාලියගොඩ මයා -රු.59,000.00 - ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත. 3.එම්.මෙත්තානන්ද මයා - රු.32,600.00 - ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත. 4.එල්.රාජපක්ෂ මයා - රු.50,943.00 මෙම ණය ශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් නිලධාරියාගේ වැටුපෙන් මාසිකව අයකර එවනු ලබයි. ඒ අනුව රු.44,943.00 ක ණය ශේෂයක් තවදුරටත් අයවීමට ඇත. මේ අනුව ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි.

ඒ.පී.ජී.එස්. අමරතුංග
පළාත් ජේෂකර්ම අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් ජේෂ කර්ම දෙපාර්තමේන්තුව
අංක 71 ශ්‍රීමත්පදාන මාවත
මහනුවර

පාර්ලිමේන්තු මාලාවේ අංකය – 492

ආයතනයේ නම – මධ්‍යම පළාත් සේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු සඳහා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
167	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	අනුමත කාර්ය මණ්ඩලයට අනුව, සීමාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් 05ක අතිරික්තයක් පවතී. 2022 වර්ෂයේ බඳවාගත් උපාධිදාරීන් තිදෙනෙකු මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීමත් වරින් වර ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරන අවස්ථා වලදී නිලධාරීන් අනුයුක්ත කිරීමක් හේතුවෙන් මෙම අතිරික්තය නිර්මාණය වී ඇත. මෙම දෙපාර්තමේන්තුවට අයත් සේෂකර්ම මධ්‍යස්ථාන, ඩයි මධ්‍යස්ථාන හා අලෙවිසැල් 173 ක සියලු පරිපාලන කටයුතු සිදු කරනුයේ ප්‍රධාන කාර්යාලය මගිනි. එසේම 2025 වර්ෂයට අනුව මෙම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදනය කරන ලද රෙදිවල වටිනාකම රු104,627,565.39 ක් වන අතර එම වර්ෂයේ අලෙවි ආදායම රු.96,112,782.31කි. මෙවැනි වාණිජමය දෙපාර්තමේන්තුවක පවතින රාජකාරී වපසරිය අනුව, සේවයේ යෙදෙන නිලධාරීන් අතරින් කළමනාකරණ සේවා නිලධාරීන් තිදෙනෙකුගේ ඌනයක්ද පවතී. මේ වන විට සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු රා.ප.ච.14/2022 අනුව නිවාඩු ලබාගෙන සිටී. එසේම දෙපාර්තමේන්තුවේ සිටින කර්මාන්ත ප්‍රවර්ධන නිලධාරී තනතුර, දරන්නාට පුද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් ඔවුන් විශ්‍රාම ගන්නා අවස්ථාවන්හි එම රාජකාරී ඉටු කිරීමද මෙම සංවර්ධන නිලධාරීන් වෙතින් සිදු වේ. ඒ අනුව ඌනව පවතින කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 03, නිවාඩු ලබා සිටින නිලධාරීන් 02 හා විශ්‍රාම ලබා සිටින කර්මාන්ත ප්‍රවර්ධන නිලධාරිනියගේ රාජකාරී කටයුතු සියල්ල සිදු කරනුයේ අතිරික්තයක් වශයෙන් සැලකෙන මෙම සංවර්ධන නිලධාරීන් මගිනි. ඒ අනුව ඔවුන් සඳහා විධිමත් පරිදි මේ වන විට රාජකාරී පවරා ඇති අතර ඔවුන්ගේ සේවය ඵලදායීව දෙපාර්තමේන්තුව වෙත ලබා ගන්නා බව කාරුණිකව සඳහන් කරමි.

ඒ.පී.පී.එස්. අමරවංශ
පළාත් සේෂකර්ම අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් සේෂ කර්ම දෙපාර්තමේන්තුව
අංක 71 ශ්‍රීමත්පදාන මාවත
මහනුවර

පාර්ලිමේන්තු මාලාවේ අංකය – 492

ආයතනයේ නම – මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු සඳහා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
167	ආයතනය පිළිබඳව මහජනයාට තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා යටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු, අන්තර්ජාලය මගින් ,අත්පත්‍රිකා, ප්‍රදර්ශණ මගින් මෙන්ම තාවකාලික අලෙවිසැල්, ණය පදනම මත සිදු කරන ප්‍රවර්ධනයන් හරහා නිරන්තරයෙන් සිදු කරයි. එසේම ප්‍රධාන කාර්යාලය මගින් සෙසු අලෙවිසැල් මගින් හා පෞද්ගලිකව සිදු කරන ප්‍රචාරණයන් (whatsApp) මගින් මෙන්ම දෙපාර්තමේන්තුවෙන් හා අලෙවිසැල් මගින් පවත්වාගෙන යනු ලබන Facebook වැනි සමාජ මාධ්‍ය පිටු මගින් පාරිභෝගිකයාට හා මහජනයාට අදහස් දැක්වීමේ හැකියාව මේ වන විට පවතී. 2026 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මුදල් වෙන් කර, මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය මගින් පෙන්වාදෙන ලද නවීන වෙබ් අඩවියක් නිර්මාණය සඳහා ලබා දී ඇති ආකෘතිය අනුව මෙම දෙපාර්තමේන්තුවට අදාල වෙබ් පිටුවක් සකසා ගැනීමට අදහස් කර ඇත. එමගින් මහජනයාට පාරිභෝගිකයාට තම පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට හැකි වන පරිදි ඉදිරියේදී අවස්ථාව ලබාදීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව සදහන් කරමි.

ඒ.සී.සී.එස්. අමරතුංග
පළාත් පේෂකර්ම අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් පේෂ කර්ම දෙපාර්තමේන්තුව
අංක 71, ශ්‍රීමත්පදාන මාවත
මහනුවර

පාර්ලිමේන්තු මාලාවේ අංකය – 492

ආයතනයේ නම – මධ්‍යම පළාත් ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු සඳහා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
167	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව / ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ වීය.	ආයතනයේ ගිණුම් පිළිබඳ 2025 වර්ෂයේ විගණන මතය තත්වාගණනය කල මතයක් වන අතර ඒ සඳහා පදනම් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කරමින් ආයතනය පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව සදහන් කරමි.

ඒ.පී.කී.එස්. අමරතුංග
පළාත් ජේෂකර්ම අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් ජේෂ කර්ම දෙපාර්තමේන්තුව
අංශ 41 ගුරුදෙණිය මාවත
මාතලේ

පාර්ලිමේන්තු අනුක්‍රමික අංකය - 79

ආයතනයේ නම - ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය

492 වන පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
167	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලයක් පවතින්නේ සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලයේ පමණි. 02. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තක්සේ කාර්ය මණ්ඩලය	අතිරික්ත සංඛ්‍යාව	පූරප්පාඩු සංඛ්‍යාව
කළමනාකරණ සේවා නිලධාරී	20	13	00	07
සංවර්ධන නිලධාරී	44	49	05	00
එකතුව	64	62	05	07

ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සමස්ත කළමනාකරණ සේවා නිලධාරී හා සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය 64 ක් වන අතර, දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 62ක් බව සඳහන් කරමි. එනම් පූරප්පාඩුව පවතින කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 07ට අයත් රාජකාරි කටයුතු අතිරික්තව පවතින සංවර්ධන නිලධාරී තනතුරු 05න් ආවරණය කර ගැනීම සිදුවේ. ඒ අනුව සමස්තයක් ලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා ගැනීමක් සිදුව නොමැති බවද සඳහන් කරමි.

තවද පවතින කළමනාකරණ සේවා නිලධාරී පූරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කර දෙන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති අතර, ඒ අනුව පවතින කළමනාකරණ සේවා නිලධාරී පූරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වූ වහාම අතිරික්තව පවතින සංවර්ධන නිලධාරී සංඛ්‍යාව තුලනය කළ හැකි බවද කාරුණිකව සඳහන් කරමි.

167	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඡේද අංක (01) හි විධිවිධාන අනුව 2018 වර්ෂයේ සිට ආයතනයේ සේවයේ නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුවද, එම කාරණය 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 02/2018(I) මගින් සංශෝධනය කර ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 සඳහන් පරිදි වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බැවින් අදාල ගිවිසුම් කාර්යය මණ්ඩලය වෙත ලබා දී නොමැති බව සඳහන් කරමි. තවද 02/2018(I) චක්‍රලේඛයේ විධිවිධාන අනුව මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර 02/2018 චක්‍රලේඛයේ ඡේද අංක 6 හි සඳහන් උපදෙස් අනුව එම සැලැස්ම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බවද වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.

මධුනාමි ප්‍රනාන්දු
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
පළාත් සභා සංස්ථාපිත
පල්ලේකැලේ. කුණ්ඩසාලේ

පාර්ලිමේන්තු අනුක්‍රමික අංකය - 79

ආයතනයේ නම - ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය

492 වන පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
167	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත් මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා විගණකාධිපතිවරයාගේ මතයට අනුව ලබා දී ඇත්තේ තත්ත්වාගණනය කළ මතයකි. එහිදී පෙන්වා දී ඇති අඩුපාඩු මේ වන විට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

මධ්‍යම පළාත
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
පළාත් සභා සංකීර්ණය
පල්ලෙබැද්දාගෙදර, කුණ්ඩසාලේ

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492

ආයතනය - මධ්‍යම පළාත් සභා ලේකම් කාර්යාලය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගන්නා ලද දුර්වලතා	දුර්වලතා මගහරවා ගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
168	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සම්ක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ භාණ්ඩ සම්ක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වුවද 2024 වර්ෂයේ භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව 2025.03.17 දිනැතිව හා 2025 වර්ෂයේ භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව 2026.03.30 දිනැතිව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මේ වන විට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු වන බව කාරුණිකව සඳහන් කරමි.
168	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	KE-3880 බෙන්ස් රථය මධ්‍යම පළාත් වාහන අපහරණ කමිටුව වෙත දෙවතාවක් යොමු කර තිබුනද කමිටුව විසින් දෙවතාවේදීම මෙම රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි ආයතනයක් වෙත මෙම රථය ලබා දෙන ලෙස නිර්දේශ කර තිබුණි. කෙසේ නමුත් වාහනය භාර ගැනීමට කිසිදු ආයතනයක් ඉදිරිපත් නොවුණි. පසුව රාජ්‍ය ආයතන වල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව අපහරණය කිරීමේ වැඩපිළිවල යටතේ මෙම රථයද අපහරණය කිරීම සඳහා තක්සේරු කමිටුව වෙත යොමු කර තක්සේරු කර වාහන අපහරණය කිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලදී. එහිදී මෙම රථය සඳහා තක්සේරු මුදල ඉක්මවා ලංසු නොලැබීම හේතුවෙන් නැවතත් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගනිමින් තක්සේරු කිරීමේ කටයුතු සඳහා වාහනයේ තොරතුරු ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ඉල්ලා ඇති අතර එම තොරතුරු ප්‍රධාන ලේකම් වෙත 2026.06.08 දිනැතිව යොමු කර ඇත.
168	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	පළාත් භාණ්ඩාගාරයෙන් අග්‍රිම නොලැබීම හා එම කාල වකවානුවේ වියදම් සීමාකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී 541-3-2-0-2102 වැය විෂයේ සම්පූර්ණ ප්‍රතිපාදනය ඉතිරිවී තිබුනද මේ වන විට එය නිවැරදි කර ගෙන ඇති අතර ඒ අනුව 2025 වර්ෂයේ කිසිදු වැය විෂයක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී නොමැති බව කාරුණිකව සඳහන් කරමි.
168	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා සභා ලේකම් කාර්යාලයේ අවසන් ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කරන ලද මතයක් ලබා දී ඇත. එම තත්ත්වාගණනය කරන ලද මතයට පදනම් වී ඇති ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.

සුදෝසී අතර. ප්‍රේමලාල්ගාගෙ
සභා ලේකම්
මධ්‍යම පළාත් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
168	මසක් තුළ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොයැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	තාක්ෂණ දූහුණු ආයතන වලින් හා විෂය නිළධාරීන් මඟින් විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.ඒ අනුව මේ වන විට නියමිත දිනට අභ්‍යන්කර විගණන විමසුම් පිළිතුරු යැවීමට හැකි වී ඇත.

එම්.බී.යූ.එස්.කොන්සිවත්ක,

පළාත් අධ්‍යක්ෂ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
168	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අප අමාත්‍යාංශය ලබා ගෙන ඇති විගණන මතය තත්ත්වාගණනය කල මතයක් බව කාරුණිකව දැනුම් දෙමි. තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කරගෙන ඇති ගිණුම්කරණ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

එම්.බී.යූ.එස්.කොන්සිවත්ත,

පළාත් අධ්‍යක්ෂ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (සැලසුම් සහ ප්‍රගති පාලන)

492 දරණ පාර්ලිමේන්තු ප්‍රකාශනමාලාවේ සඳහන් පිටු අංකය	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
168	ඇතැම් වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉනිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2023.01.27 දිනැති අයවැය වක්‍රලේඛ 01/2023 අනුව 2023 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්ථන වියදම් දැඩි ලෙස සීමා කරන ලදී. ඒ අනුව, පෙර වර්ෂයේ පුරෝකථනය කරමින් 2023 වර්ෂයේ සැලසුම් කල පහත ව්‍යාපෘති පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක කිරීම වාරණයට ලක් වීම හේතුවෙන්, එම වැය විෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි විය. 547-56-4-0-1702 - අනපේක්ෂිත සේවා 547-56-4-0-2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ
168/169	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	2023 වසරේ පැමිණිලි ලේඛණයක් නොතිබුණද අප ආයතනය වෙත ලැබෙන පැමිණිලි සඳහා ඉක්මනින් ක්‍රියාත්මක වීම සිදුවන බැවින්, මෙතෙක් ඒ සම්බන්ධව වෝදනාවක් ලැබී නොමැත. තවද,මේ වන විට පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛනයක් පවත්වාගෙනයනු ලැබේ.

පාර්ලිමේන්තු මාලා අංකය - 492

ආයතනයේ නම - ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මාලා අංකය - 492	වාර්තාව මගින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග /වත්මන් තත්ත්වය
1හ9	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අදාළව මේ වන විට www.rdd.cp.gov.lk නමින් වෙබ් අඩවියක් නිර්මාණය කර මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු සිදු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	ආයතනයේ පවත්වායගන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අදාළව www.rdd.cp.gov.lk මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවත මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2023 අවසන් වර්ෂය සඳහා මූල්‍ය විගණනය සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට තත්ත්වාගණනය කළ විගණනය මතයක් ලැබී ඇති අතර, එම විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දෙන ලද අඩුපාඩුවලට අදාළව විගණනය වෙත පිළිතුරු සපයා ඇති බව කාරුණිකව යදහන් කරමි.

උපෙක්ෂා චාමි වීරසිංහ
පළාත් අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මලාවේ අංකය - 2023 – 492

ආයතනයේ නම - සමාජ සේවා සුභසාධන පරිවාස හා ළමා රක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත.

පාර්ලිමේන්තු මලාවේ පිටු අංකය - 492	වාර්තාව අනුව හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්වය
පිටුව 169	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම යන ලද, 1.යූ.ජී.එස්.මාලනී මිය රු. 102,676.00 2. ඒ.ජී. ජයරත්න ගමගේ මයා රු. 184,655.00 3. එච්.එම්.කුඩා මැණිකේ මිය රු. 54,800.00 4. ඩී.එම්.ජී.ජී. නන්දාවතී මිය රු. 91,625.00 එකතුව 433,756.00 යන නිලධාරීන්ගේ රු.433,756.00 ක් වූ ණය ශේෂ එකතුව, 2024.03.31 දින වන විට නිරවුල් කරන ලදී.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ගිණුම්කරණ අඩුපාඩු අවම කර ගැනීමට මේ වන විට කටයුතු කර ඇත.

ඒ. එම්. ඩී. සී. ඩබ්. ගුණරත්න
ලේකම්
සමාජ සුභසාධන, පරිවාස හා
ළමාරක්ෂක සේවා අදාළ අමාත්‍යාංශය
මධ්‍යම පළාත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - **492**

ආයතනයේ නම - **මධ්‍යම පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

492 පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
169	සමාලෝචිත වර්ෂය තුළ විගණන කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ සිව්වන කාර්තුවේ විගණන කළමනාකරණ රැස්වීම පැවැත්වීම සැලසුම් කළ පරිදි අදාළ කාර්තුව අවසන් වීමට පෙර පැවැත්වීමට නොහැකි වූ අතර එය 2024.01.30 දින පවත්වා ඇති බව පිළිගන්නා අතර 2024 හා 2025 වර්ෂවල පූර්ව කාල සටහන් පරිදි කාර්තු හතරෙහිම පවත්වා ඇත
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවත්ත මට්ටමේ/ අගිතකර මට්ටමේ විය.	1.**ගිණුම්කරණ අඩුපාඩු** ➢ 2022.12.31 වන විටත් සිගාස් වැඩසටහනේ වත්කම් ගිණුමෙන් ඉවත් නොකරන ලද 2019 වෙන්දේසි කළ දෙපාර්තමේන්තුවට අයත් රෝනියෝ යන්ත්‍රය 2023.05.31 සිගාස් වැඩසටහනේ වත්කම් ගිණුමෙන් ඉවත් කිරීමට (Dispose) කටයුතු කර ඇත. (ඇමුණුම: 01) 2. මූල්‍ය සමාලෝචනය **වියදම් කළමනාකරණය** **ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා** ➢ සංවර්ධන කාර්යයන් ඉලක්කගත පරිදි ඉටු කිරීමේදී හා වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතුවලදී ඊට අදාළ ප්‍රතරාවර්ථන වියදම් අවශ්‍යතාවය පරිදි වියදම් දැරීමට සිදුවීම මත වැය ශීර්ෂයන් කිහිපයක් සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත අමතර ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර එම ප්‍රතිපාදන ලබා දීමේදී 6% ප්‍රතිපාදන අඩුකර ප්‍රතිපාදන ලබා දී ඇත. **එමෙන්ම නඩත්තු වැය ශීර්ෂයන් සඳහා මධ්‍යම පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ CPC/CS/06/05/570/2023** හා 2023.07.14 දිනැති පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම-2023 නැමති ලිපියෙන් ලබාදෙන අමතර ප්‍රතිපාදනවලින් 6%ක ප්‍රතිපාදන අවුරා නැඹීම අවශ්‍ය නොවන බව දන්වා ඇත. ඒ අනුව ප්‍රතිපාදනවලින් 6%ක සම්බන්ධයෙන් ජාතික අයවැය වක්‍රලේඛ අංක 01/2023 හා පළාත් භාණ්ඩාගාරයෙන් ලද උපදෙස් අනුව කටයුතු කර ඇත. (ඇමුණුම: 02) ➢ මධ්‍යම පළාත් මූල්‍ය රීති 7.2.1 අනුව 2023 වර්ෂයේ ඇස්තමේන්තුව හැකිතාක්දුරට නිවැරදිව හා තාත්විකව සකස් කිරීමට කටයුතු කළ නමුත් ඇතැම් නොවැළැක්විය හේතූන් මත මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර විචල්‍යතාවයක් ඇති වූ නමුත් 2024 වර්ෂයේ දී එම දෝෂ මහහරවා ගැනීමට කටයුතු කරන ලදී.

අයි.එස්. රත්නායක
ප්‍රවාහන කොමසාරිස්
ප්‍රධාන දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත


492 පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
169		➢ සීමා නිර්ණයෙහි හර ශේෂයන්ගේ උපරිම සීමාව ඉක්මවීමක් සිදු වී නොමැති බව කාරුණිකව දන්වමි.(ඇමුණුම: 03) **3. මෙහෙයුම් සමාලෝචනය** **කාර්යසාධනය** ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන රු මි.5 හා උපමාන පාදක සංවර්ධන ප්‍රධාන රු මි. 5 ලෙස රු. මිලියන 10ක් වෙන් කර තිබුණි. නමුත් භාණ්ඩාගාරයෙන් අග්‍රිම කොටසක් පමණක් ලබාදුන් අතර උපමාන පාදක ප්‍රදාන යටතේ වූ ව්‍යාපෘති සඳහා අග්‍රිම ලබා දීම සිදු කර නොමැති බැවින් 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ➢ **කළමනාකරණ දුර්වලතා** මෙම දෙපාර්තමේන්තුව වෙත එක් වාහනයක් පමණක් වෙන්ව ඇති අතර, සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රතිපාදන සීමාව අනුව වාහන 02 ක් නඩත්තු කිරීමද අපහසු වේ. එබැවින් ප්‍රවාහන කොමසාරිස්ගේ නිල රාජකාරි ගමන් සහ දෙපාර්තමේන්තුවේ පොදු රාජකාරි ගමන් සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති සංචිත වාහනය යොදා ගනු ලැබේ. ප්‍රවාහන කොමසාරිස් තනතුර සඳහා නිල වාහනයක් භාවිතා කරන්නේ නම් ඒ සඳහා වෙනම රියැදුරෙකු පඩිනඩි ගෙවීමට සහ එම වාහනය නඩත්තු කිරීමට වෙනුවෙන් දැනට වැය වන මුදලට වැඩි මුදලක් දැරීමට සිදු වන බැවින් එය රජයට අවාසි සහගත වන බව කාරුණිකව දන්වමි. 4. **මානව සම්පත් කළමනාකරණය** පත්වීම් බලධාරියා වන මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ වන විට එම පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කර ඇත. තත්වාගණනය කළ මතයක් දැනට ලබා ගෙන ඇති අතර, ඉදිරියේදී තත්වාගණනය නොකළ මතයක් ලබා ගැනීම සඳහා ආයතනයේ ගිණුම් කටයුතු කාර්ය සාධකය ඉහළ නැංවීම සඳහා අධීක්ෂණ ක්‍රමවේද, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම හා මානව සම්පත සවිබල ගැන්වීම නිරන්තරයෙන් සිදු කරයි.

ඒ.ඒ.ඒස්. රත්නායක
ප්‍රධාන කොමසාරිස්
ප්‍රවාහන දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මාලාවේ අංකය - : 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු/වක්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
පළමු කොටස : 98.00		
170	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද , අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට නිවැරදි කර ඇත.
170	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මෙම දෙපාර්තමේන්තුවට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව **12** කි. **2023.12.31** දිනට සංවර්ධන නිලධාරීන් **04** දෙනෙකු අතිරික්තව සිටින ලදී. නමුත් **2024, 2025** වර්ෂවල ස්ථානමාරු යටතේ නිලධාරීන් ස්ථානමාරුවී ගොස් ඇති බැවින් මේ වන විට එක් සංවර්ධන නිලධාරිනියක් පමණක් අතිරික්ත වේ. නමුත් **2026.01.01** දින සිට එක් සංවර්ධන නිලධාරිනියක් රා.ප.ව.ලේ. **14/2022** අනුව දේශීය නිවාඩු ලබා ගොස් ඇත. එබැවින් මේ වන විට සංවර්ධන නිලධාරී තනතුරේ සක්‍රිය සේවයේ නියුතු වන්නේ අනුමත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බව කාරුණිකව සදහන් කරමි.
දෙවැනි කොටස : 95.00		
170	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	කත්ත්වාගණනය කළ මතයක් ලැබී ඇත.



ඩබ්.එම්.ඩී.ඩබ්.බී. රත්නායක
මහේෂ්වර ජනාධිපති සෙවණැලි
මලුත් ආදායම් දෙපාර්තමේන්තුව
34අ, බවුන්තියාව පාර, [illegible]

පාර්ලිමේන්තු මාලාවේ අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
170	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවත්ත මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	**2023.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුව ලබා ගෙන ඇති විගණන මතයය අභිතකර හෝ ව්‍යාවත්ත මට්ටමේ නොවන අතර, තත්වාගණනය කල මතයයක් බව කාරුණිකව දන්වමි. තත්වාගණනය කල මතය සඳහා පදනම් කරගෙන ඇති ගිණුම්කරණ අඩුපාඩු මග හරවා ගැනීම සඳහා අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇති බව වැඩිදුරටත් දන්වමි.

එම.ජූ.ඩබ්.ශිරෝමනී
සමුපකාර සංවර්ධන කොමසාරිස්
හා සමිති රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	දැඩිපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වර්තමාන තත්ත්වය
170	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවත්ත මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුව ලබාගෙන ඇති විගණන මතය තත්ත්වාගණනය කළ මතයක් බව කාරුණිකව දැනුම් දෙමි.තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කරගෙන ඇති ගිණුම්කරණ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවද වැඩි දුරටත් සඳහන් කරමි.

ඉංජි. සී. එම්. එස්. දිසානායක,

පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,

මධ්‍යම පළාත.

ඉංජි.සී.එම්.එස්. දිසානායක
පළාත් වාරිමාර්ග අධිකාරී
පළාත් වාරිමාර්ග ඉඩකඩපරිශ්‍රයවල
මධ්‍යම පළාත
අංක 5ජ්, සෘණ මාවත, අසිරි පෙරේදෙණ,
පල්ලේගොඩ, පුත්තිරිගාවේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් යෞවන කටයුතු ,වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
170	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අප අමාත්‍යාංශය ලබා ගෙන ඇති විගණන මතය තත්ත්වාගණනය කළ මතයක් බව කාරුණිකව දැනුම් දෙමි. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කරගෙන ඇති ගිණුම්කරණ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ලේකම්,
යෞවන කටයුතු , වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන,
සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය.

[illegible]
ලේකම්
යෞවන කටයුතු,වනිතා කටයුතු,
ග්‍රාමීය සංවර්ධන,සමුපකාර සංවර්ධන
හා කර්මාන්ත අමාත්‍යාංශය මධ්‍යම පළාත
[illegible]

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ පිටු අංක (series 492)	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති පියවර/වත්මන් තත්ත්වය
171	විගණකාධිපති වීමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි	මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව, අභ්‍යන්තර විගණන වැඩසටහන 2021 වර්ෂයේ ආරම්භයේදී පිළියෙල කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වැඩසටහන නියමිත පරිදි සකස්කර මධ්‍යම පළාත් විගණන අධිකාරී වෙත අනුමැතිය සඳහා යොමුකර ඇත.
171	හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි	මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාලෙන ඇති අතර එහි ප්‍රගතිය මැන බැලීම සඳහා 2024 වර්ෂයේ සිට පහත සඳහන් දර්ශක නියම කර ඇත. 1. සමූපකාර සේවකයින් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 2. සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 3. ජංගම සේවා සංඛ්‍යාව 4. ක්ෂේත්‍ර චාරිකා/නිරීක්ෂණ සංඛ්‍යාව 5. වැටුප් වැඩිකිරීමේ ප්‍රතිශතය 6. නීකුත් කරන චක්‍රලේඛ සංඛ්‍යාව

කේ.ඒ.එල්. සරිවඤ්ඤ
බී.ඉං.ප.සේ. I
සල්කම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය හා පිටුව	වාර්තාවෙන් හඳුනාගෙන ඇති ගැටළු	අඩුපාඩු/වත්මන් තත්වය පිළිබඳව නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
492 - 171	අදාල කාර්ය සාධනය ඇගයීම ප්‍රකාරව පහත සඳහන් දුර්වලතා හඳුනාගනු ලැබ අතර , ඒ කෙරෙහි ආයතනයේ විශේෂ අවධානය යොමු විය යුතුය. යන්න සඳහන් කලද මේ පිළිබඳ අඩුපාඩු සඳහන් කර නොමැත.	නිවාස දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ විගණන මතය තත්ත්වාගණනය නොකල යහපත් මතයක් විගණනය විසින් ලබාදී ඇති අතර, මුළු ලකුණු 98.5% ප්‍රමාණයක් ලබා ගනිමින් සමස්ථ ඇගයීම් වලින් ඉහළ මට්ටමක සාථකත්වයක් ළඟා කර ගැනීමට හැකි වී ඇත. 2023 වර්ෂය තුලදී අභ්‍යන්තර පාලන පද්ධති වල තව දුරටත් හඳුනා ගත හැකි දුර්වලතාවයන් පවතීද යන්න සොයා බලා කටයුතු කිරීමත් හේතුවෙන්, මෙම වර්ෂය තුලදී මෙම දෙපාර්තමේන්තුවට තත්ත්වාගණනය නොකළ යහපත් විගණන මතයක් ලබා ගැනීමට හැකි වී ඇත. 2023 වර්ෂයේත් පැවති ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් අක් මුදල් නොලැබීම සම්බන්ධ පාලනය කළ නොහැකි සාධක හේතුවෙන් සැලසුම් කල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කල නොහැකි විය. මේ වන විට අක් මුදල් නිසි පරිදි ලැබෙන අතර සැලසුම් කල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉදිරියේදීද මෙම දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වය දිගටම පවත්වා ගනිමින් විගණනය මගින් ලබා දෙන උපදෙස්ද අනුගමනය කරමින් දෙපාර්තමේන්තු අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඒ. ඩබ්. ජී. කෝ. වඩුගොඩ
පළාත් නිවාස කොමසාරිස්
මධ්‍යම පළාත් සිවිල දෙපාර්තමේන්තුව
මහනුවර

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා අංකය - 492

ආයතනයේ නම - ප්‍රධාන ලේකම් කාර්යාලය (පිරිස් හා පුහුණු අංශය)

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලාවේ 492	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතන විසින් ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පිටු අංකය 171	ඇතැම් වැය විෂය සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	543-3=3-1401 යටතේ වන වැය විෂය පිරිස් හා පුහුණු අංශයේ නිල වාහනය සම්බන්ධයෙන් ප්‍රවාහන දීමනාව ඇරීම සඳහා වූ වැය විෂය බවත්, යම්හෙයකින් ප්‍රවාහන දීමනා අවශ්‍යතාවය හේතුවෙන් අමතර ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට සිදු උවහොත් එම කාර්ය උදෙසා සංකේත ප්‍රතිපාදනයක් වෙන් කර තැබීමේ අවශ්‍යතාවය මත මෙම රු. 1000 /- ක මුදල වෙන් කර තැබූ බවත්, 2026 ජනවාරි මස සිට මෙම වැය විෂය ඉවත්කර ඇති බවත් කාරුණිකව දන්වමි.

ඒ.ඒ. අමරකෝන්
අයෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය
මඩකම පළාත

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය:- 492

ආයතනයේ නම :- මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංකය	කමිටුව මඟින් හඳුනා ගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්වය
172	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	රැකියා විරහිත උපාධිධාරීන්/ ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ බඳවාගත් පුහුණු අභ්‍යාසලාභීන් රාජ්‍ය සේවයේ කනතුරුවලට ස්ථිර පදනමින් පත්කිරීමට පළාලව බඳවාගත් උපාධිධාරීන් දෙදෙනෙකු මෙම ආයතනයේ අතිරික්ත සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් සේවය කරනු ලැබූ අතර, එම එක් නිලධරයෙක් 2023.11.25 දින සිට විදේශ නිවාඩු ලබා ඇත. රැකියා විරහිත උපාධිධාරීන්/ ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ බඳවාගත් උපාධිධාරීන් ස්ථිර සේවයට පත්කිරීමට හා අනුයුක්ත කිරීමට 2021.09.13 දින රැස්වූ ඇමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති බව, සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, ප්‍රධාන ලේකම්වරු, කොමිෂන් සභා ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමතන ලද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GT/2020(III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපියෙන් දන්වා සැත. උක්ත දක්වා ඇති ලිපියේ 06 ඡේදයේ iv හා v කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන අතර, v හි "අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කර ඇති සියලු නිලධරයන්ට රාජකාරී භාරගැනීමට අවස්ථාව සලසා දීමද, කිසිදු නිලධාරියෙකු අතිරික්ත නිලධාරීන් ලෙස කටයුතු නොකිරීමද මැනවි" ලෙස දක්වා ඇත.

ශෝභිත වික්‍රමසිංහ මහතා
ලේකම්
ජාතික සංවිධාන සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංකය	කමිටුව මඟින් හඳුනා ගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග /වත්මන් තත්වය
		තවද, ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (IV) හා 2024.06.07 දිනැති චක්‍රලේඛයේ 2.6 හි යඳහන් පරිදි "නිවාඩු ලබන නිලධරයාගේ තනතුර ආයතනය තුල පූරප්පාඩුවක් ලෙස සළකා පූර්ණකාලීනව වෙනත් නිලධරයකු පත් කිරීමට/ ස්ථාන මාරු කිරීමට පත්කිරීම් බලධරයාට අවස්ථාව ඇත" යන්න දක්වා ඇති බැවින්, මේවන විට විදේශගතව සිටින නිලධාරියාගේ තනතුර පුරප්පාඩුවක් ලෙස සැලකිය හැකි අතර, එක් අතිරික්ත නිලධාරියෙකු පමණක් මෙම කාර්යාලයේ සේවය කරන බව කාරුණිකව දන්වමි.

මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

පාර්ලිමේන්තු ප්‍රකාශන අංකය - 492

ආයතනයේ නම - කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

පළමු කොටස 69.00

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වක්මන් තත්ත්වය
256	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය	වර්තමානයේ ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.දැනට පළාත් විගනන දෙපාර්තමේනතුව මගින් 2026.06.19 දින ඉදිරපිත් කර ඇති විගණන විමසුම් සඳහා පමණක් පිළිතුරු සැපයීමට ඇත
256	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන නිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය ප්‍රකාරව හෝ ආයතනයට අදාල ප්‍රඥප්ත්ය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කිසිදු නිලධාරියෙක් බඳවා ගෙන නොමැත. මේ පිළිබඳව පැහැදිලි කිරීම් අමුණා ඇත. (ඇමුණුම - 01)
256	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒවායේ වාර්තා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	වර්තමානයේ ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
256	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි	වර්තමානයේ එම නිර්දේශයන් ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

ටී.ජී.ඉ.චිත්‍රා සොයිසාවේදී
අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් සංවර්ධන අධිකාරිය (REDA)
109, පාර පළාත් සභා සංකීර්ණය
මාවුලිය පිටිය, මාතලේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් තත්ත්වය
256	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පිහිටුවීමට පෙර ක්‍රියාත්මක වූ GTZ (ජර්මානු ආර්ථික සහයෝගිතා ව්‍යාපෘතිය) වෙත මෙම වාහන තුන ව්‍යාපෘති කටයුතු සඳහා භාර දී ඇත. එම ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟම , මධ්‍යම පළාත් සභාව විසින් 2008 වර්ෂයේ අංක 01 දරණ ප්‍රඥප්තිය මගින් , එහි කාර්යයන් කවදුරටත් පුළුල්වී ඉදිරියට ගෙනයාම පිණිස මෙම කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පිහිටුවා ඇත. මේ අනුව ජාතිය ගොඩනැගීමේ හා වතුයටිනල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ NDB&EID/ESSP/04 හා 2007.06.20 දිනැති ලිපිය මගින් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් හා තවත් අයටද පිටපත් සහිතව ජර්මන් ආර්ථික සහයෝගිතා ව්‍යාපෘතියේ ජාතික අධ්‍යක්ෂ අමතන ලද ලිපිය මගින් මෙම වාහන තුන ඇතුළු සියළුම වත්කම් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වෙත භාරදී ඇත. (ඇමුණුම - 6) මෙම වාහන වල අයිතිය පවරා ගැනීම සඳහා අදාල නිලධාරීන් මුණගැසී විවිධ අවස්ථාවල උත්සාහ දරා ඇති නමුත්, නිශ්චිත තොරතුරක් ලබා ගැනීමට නොහැකි වී ඇත. එමෙන්ම රේඛීය අමාත්‍යාංශවල විෂය පථයන් විවිධ කාලසීමාවලදී වෙනස්වීම් මත තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම පවරා ගැනීම් මෙතෙක් සිදු කර ගැනීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ප්‍රධාන ලේකම් මගින් 2026.04.21 දිනැතිව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇත.

ඒ.ජී.ඉ.ඒ. සොයිසාවේ
අධිකාරී
නව පුනර්ජනනීය ශක්ති සේවා (REDA)
109, ඔව් අලුත් කඳ පොළොන්නරුව
පළාත්පාල පිළිබඳ ඇමැතිති.

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් තත්ත්වය
256	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෛනික ධාවන සටහන් වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
256	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	එක් එක් නිලධාරීන්ගට රාජකාරි පැවරීම් ලිපිය මඟින් බලය පැවරීම සිදු කර ඇත. පළාත් මූල්‍ය රීති ප්‍රකාරව සකස් කර බලය පැවීම සිදුකිරීමට කටයුතු කරමි.
256	මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුළ සන්නිවේදනය කර නොමැත.	ආයතනය තුළ සන්නිවේදනය කර ඇත.
256	මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙනුවක්ම අවම කරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි	ආයතනය තුළ සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකුගේ අධීක්ෂණයෙන් සිදුවන අතර , විශේෂයෙන්ම ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන් වල ගෙවීම් නිලධාරීන් තිදෙනෙකුගේ අධීක්ෂණයෙන් සිදු කරන බව සඳහන් කරමි.



ඒ.බී.ඩ්‍ලිව්.පී. කොඩිතුවක්කු
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සංවිධාන ආයතනය (REDA)
109, කළු පල්ලියේ පාර කොස්වත්ත
රාජගිරිය මාවත, බොරැල්ල,

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ ඉටිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් කත්ත්වය
256	අධිකාරියට අදාලව ප්‍රඥප්ති අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙළ කර නොනිබුණි.	ප්‍රඥප්තියට අනුව මේ දක්වා ම රජයේ මූල්‍ය රීති සංග්‍රහයට හා ආයතන සංග්‍රහයට අනුගතව කටයුතු සිදු කරගෙන යනු ලැබේ.
256	සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය නියමිත දිනට පෙර අනුමත කරවාගෙන නොනිබුණි	වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කර ගැනීම වර්ෂයේ පළමු කළමනාකරණ මණ්ඩලය රැස්වීම මගින් සිදු කර ඇත.නමුත් මෙම වසරේ සිට ඉදිරි වර්ෂයට නියමිත අයවැය ලේඛනය මෙම වසර අවසානයේදී කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.
256	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොනිබුණි	මෙම කාර්යාලයේ ප්‍රමාණවත් නිලධාරින් සංඛාවක් නොමැතිවීම හේතුවෙන් විගණන විෂය සඳහා වෙනම අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර අභ්‍යන්තර විගණන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව දුෂ්කර බව නිරීක්ෂණය කරමි. එමනේම මෙම ආයතනයේ විගණන කළමනාකරණ රැස්වීම් පවත්වනුයේද ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙනි. තව ද පළාත් සභා විගණන දෙපාර්තමේන්තුව මගින් ද මෙම ආයතනයේ අභ්‍යන්තර විගණන කාර්ය සිදු කර ගැනීම වඩාත් සුදුසු බව ද නිරීක්ෂණය කරමි.
256	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොනිබුණි	වර්තමානයේදී වර්ෂය තුළ කාර්තු හතරටම අදාලව රැස්වීම් විධිමත් පරිදි ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් පවත්වා ගෙන යනු ලැබේ.
256	ඇතැම් වැය ශීර්ෂයන් සඳහා සලසා තිබූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය	අප ආයතනය රාජ්‍ය ප්‍රතිපාදන වලින් නොරව ආදායම් උත්පාදනය කර පවත්වාගෙන යන ආයතනයක් බැවින් ප්‍රතිපාදන ඉතිරි කර ගනිමින් ආයතනික කටයුතු සිදු කරයි.

ඒ.ජී.ඩබ්.ඒ. ධර්මසේකර
අධිකාරී
ශ්‍රී ලංකා සංවේදීතා ආයතනය (REDA)
109, මව පළාත් සභා පොල්හෙන්මුල්ල
හවිතුවර වීදිය, මහනුවර.

පාර්ලිමේන්තු පුකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් තත්ත්වය
256	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීමට පියවර ගනිමින් ඇත.
256	පළාත් මූලය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරෑ අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි	ආයතනයේ කටයුතු මුදල් රෙගුලාසි හා නීතිරීති වලට අනුකූලව සිදු කිරීමට උක්සාහ කළ බැවින් හා මාතලේ හෝටල් පාසැලේ ප්‍රායෝගික පරීක්ෂණ අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස ලබා ගත් අත්තිකාරම් පියවීමට ප්‍රථම වෙනත් පාඨමාලා ප්‍රායෝගික පරීක්ෂණ ආරම්භ වීම මත තවත් අත්තිකාරම් ලබාදීමට සිදුවේ. එමෙන්ම මාතලේ හෝටල් පාසැලේ රාජකාරී බහුලත්වය මත මෙම නිලධාරී මහතාට විවිධ අවස්ථාවල අත්තිකාරම් පියවීමට ප්‍රමාද වීම ද සිදුවී ඇත. මින් ඉදිරියට මෙවැනි ප්‍රමාදයන් සිදු නොකර ප්‍රායෝගික පරීක්ෂණ අවසන් වූ වහාම අදාල අත්තිකාරම් මුදල් පියවීමට පියවර ගත යුතු බව විෂය භාර නිලධාරින්ගට උපදෙස් ලබාදෙන ලදි.

එච්.ඩී.ඉ.ඒ. සොයිසාපේරු
අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සංවර්ධන ඉංජිනේරු සේවය (REDA)
ඔ.ම, වරි සඳහා ගණ කොමිසම්වරු
අධිකාරී කාර්ය, මහලේකම්.

පාර්ලිමේන්තු ප්‍රකාශන අංකය - 492

ආයතනයේ නම - කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

දෙවැනි කොටස 44.00

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් තත්ත්වය
256	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගෙන නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණි. එම අරමුණු වඩාත් නිවැරැදිව ආයතනයට උචිත පරිදි වර්තමානයේදී සකස් කර ඇත
256	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර යනාතිබුණි.. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීයම් ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	තිරසර අරමුණු සඳහාවන ඉලක්ක හඳුනාගෙන තිබූ අතර , වර්තමානයේදී වඩාත් විධිමත් කර ඇත.
256	ආයකනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටම / ව්‍යාවන මට්ටම/ අහිතකර මට්ටම විය	මෙම වර්ෂයේ දි ආයතනයේ ගිණුම් පිළිබඳව මතයක් ඉදිරිපත් කර නොමැත.
256	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවුණි..	අප ආයතනය වෙත ලද පුහුණු වැඩසටහන් සඳහා අදාල නිලධාරින් සහභාගි කරවා ඇත. ප්‍රමාණවත් නිලධාරින් සංඛ්‍යාවක් නොමැති වීම බැවින් , පවතින කාර්ය බහුලත්වය මත ඇතැම් අවස්ථාවලදී පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට නිලධාරින්හට හැකියාවක් නොවුණ බැවින් 100% සහභාගි වීමට අවස්ථා නොලැබුණි.

ඒ.ඒ.ටී.ඩබ්.ඒ. ගොඩිඔවිත්ත
අධ්‍යක්ෂ
කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය (REDA)
109, නව පළාත් සභා සංකීර්ණය
පරිපාලන මධ්‍යස්ථානය, මහනුවර.

පාර්ලිමේන්තු ප්‍රකාශන අංකය - 492

ආයතනයේ නම - කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

දෙවැනි කොටස 44.00

පාර්ලිමේන්තු ප්‍රකාශනයේ මාලාවේ පිටු අංකය	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරැදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වත්මන් තත්ත්වය
256	ආයතනය විසින්ත ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	2024 සිට 2028 වර්ෂයට අදාලව සකස් කරන ලද පස් අවුරුදු සැළැස්මට මෙම දර්ශක ඇතුළත් කර ඇත.



ඩබ්.ජී.ඒ.ඩී. සොයිසාවිත්‍රී
අධ්‍යක්ෂ
ජාතික පුනර්ජනනීය ශක්ති අධිකාරිය (REDA)
අංක 72, නව මල්වත්ත පාර හා සොයිසාපේදුර
දෙමුවත්ත පිටිපන, මහනුවර.

පාර්ලිමේන්තු ශ්‍රේණි අංකය - පාර්ලිමේන්තු ප්‍රකාශන ශ්‍රේණි අංක 492

ආයතනයේ නම - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාවෙන් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු/වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
256	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම් නිරීක්ෂණය විය.	පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ උප කාර්යාල පළාත පුරාම විසිරී පවතී. ඒ ඒ කාර්යාල වලට හා එම කාර්යාල මගින් ඉටු කරනු ලබන කර්මාන්ත වලට ලැබෙන විගණන විමසුම් සඳහා පිළිතුරු එම කාර්යාල වලින්ම ලබා ගනිමින් නිවැරදි කිරීම් වෙතොත් ඒවාද සිදුකර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට මෙසේ කාලය ගත වී ඇත. ඒ අනුව වර්තමානයේ පිළිතුරු දීමේ කාලසීමාව අඩුකර ගැනීම සඳහා විමසුම ලැබී සති දෙකක් ඇතුළත අදාල පාර්ශව සමග සාකච්ඡා කර ඒ සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. වර්තමානයේදී ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
256	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	මේ වන විට කාර්යාල කාර්ය සහායකයින් සේවයෙන් ඉවත් විම මත එම තනතුරෙහි අතිරික්ත සේවක සංඛ්‍යාවක් නොමැති බව දන්වමි. නමුත් සේවා අවශ්‍යතාවය 20කි. ඒබැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර එම තනතුරු සංඛ්‍යාව අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
256/257	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්නකයේ නොමැත.	මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතා කරන බොහෝ වාහන සහ යන්ත්‍ර ප්‍රමාණයක් දෛනික රාජකාරි කටයුතු පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය ආයතන කිහිපයකින් ම ප්‍රදානයන් ලෙස ලැබුණි. ඒ අනුව අධිකාරියේ භාවිතා කරන මෙම වාහන සහ යන්ත්‍ර පවරා ගැනීමට කටයුතු නොකරන බවට නිරන්තරයෙන් විගණනයට ලක්වීම හේතුවෙන් අප විසින් බොහෝ අවස්ථාවල දී මුල් අයිතිකරුවන්ගෙන් පවරා ගැනීමට ලිපි ඉදිරිපත් කරමින් කටයුතු කරන ලදි. එහෙත් CPC/RM/1/9/5 අංක දරණ 2023.08.06 වන දිනැති ලිපිය යොමු කරමින් ලේකම්,මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් "පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාවිතයට ගනු ලබන වාහන/යන්ත්‍රවල අයිතිය අධිකාරියට පවරා ගැනීම සම්බන්ධවයි." යන මැයෙන් ලිපියක් යොමු කර ඇත. එහි දක්වා ඇත්තේ 2023.05.09 වන දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගත් තීරණ දැනුම්දීම යටතේ "අයිතිය නියමිත පරිදි පවරා ඇති වාහන අදාළ ආයතනයේ දැවසන් ගිණුම් සඳහා ඇතුළත් කළ යුතු බවත්, අයිතිය පවරා නැති වාහන එහි වර්තමාන අයිතිකරු (ලියාපදිංචි ආයතනය) ලෙස සටහන්ව ඇති ආයතනය මඟින් දැවසන් ගිණුම්වල වත්කමක් ලෙස නිරූපණය කිරීමටත් තීරණය විය." නමුත් වර්තමානය වන විට අප වෙත භාවිතයට වාහන කිහිපයක් ම ලැබී ඇති අතර ඒවායේ මුල් අයිකරුවන් විසින් පවරාදීමට කැමතිවූ බැවින් අප විසින් සාමාන්‍යාධිකාරි, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නමින් පවරා ගැනීම් කටයුතු කර ඇති බව දන්වා සිටිමි.

ඉංජි.ජේ.එම්.ආර්.බී. ජයවර්ධන
සාමාන්‍යාධිකාරි (වැ.බ)
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
මධ්‍යම පළාත

පාර්ලිමේන්තු මාලාවේ පිටු අංකය 492	වාර්තාවෙන් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු/වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතන විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
257	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අධිකාරියේ භාවිතයෙන් ඉවත් කර ඇති වාහන අපහරණයට යෝජනා කිරීම අප විසින් 2018 වර්ෂයේ සිට මේ වන තෙක් අඛණ්ඩව සිදු කර ඇත. ඒ අනුව අධිකාරියේ ප්‍රදානයන් ලෙස දෛනික රාජකාරී කටයුතු පවත්වා ගෙන යාම සඳහා පමණක් ලබා දී ඇති මෙම වාහනවල මුල් අයිතිය මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සතු බැවින් අපහරණ වැඩසටහන්වලට තොරතුරු කැඳවන අවස්ථාවලදී භාවිතයෙන් ඉවත් කර ඇති වාහන සහ යන්ත්‍ර සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම් කටයුතු අප විසින් සිදු කර ඇත. එම තොරතුරු කැඳවීම් සිදු කර අපහරණ වැඩසටහන ක්‍රියාත්මක වී පුවත්පත් දැන්වීම් පළ කරමින් ගැණුම්කරුවන් හඳුනා ගැනීම යනු බොහෝ කාලයක් ගත වන ක්‍රියාදාමයකි. ඒ බැවින් ගර්හිත වාහන අපහරණය කිරීමට දිගු කාලයක් ගත වේ.
257	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	සෑම වසරකම අභ්‍යන්තර විගණන සැලැස්ම විගණනය සමග සාකච්ඡා කර සකස් කරන බවත් ඒ පිළිබඳ සාකච්ඡා සටහනක් නොමැති නිසා මෙය විමසුමට ලක්ව ඇති බවත් දන්වා සිටිමි. ඒ නිසා විගණනය සමග සාකච්ඡා කර සාකච්ඡා සටහනක් ලබා ගැනීම හෝ විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර එහි වාර්තාවේ සටහන් කිරීම හෝ සිදු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව වර්තමානයේ කටයුතු කර ඇත.
257	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා සති දෙකක් තුල පිළිතුරු ලබා දීමටත් එහි සඳහන් නිර්දේශයන් කඩිනමින් ක්‍රියාත්මක කර විගණනය වෙත වාර්තා කිරීමටත් අදාළ පාර්ශව දැනුවත් කර ඇත.
257	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත .ඒ අනුව එම වාර්තා වල පිටපත් වර්තමානයේ කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
257	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත .ඒ අනුව එම වාර්තා වල පිටපත් වර්තමානයේ විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
257	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිග ණය ශේෂ පැවතුණි.	හිග ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
257	පළාත් මූල්‍ය රීති ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත් කාර්යය අතුරු අග්‍රිම කාර්යය මේ වන විට පියවීමට කටයුතු කර ඇත.

ඉංජි.ජේ.එම්.ආර්.බී. ජයධර්ධන
සාමාන්‍යාධිකාරී (වැ.ප)
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
මධ්‍යම පළාත

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම - මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය

පළමු කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංකය	කම්ටුව විසින් හඳුනාගත් අඩුපාඩු/දුර්වලතා	අඩුපාඩු/ වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග
257	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම මාසකට වඩා වැඩි කාලයකට ප්‍රමාද කිරීම නිරීක්ෂණය විය.	මෙම තත්වය නිවැරදි කරගැනීමට කටයුතු කරමි.
257	අධිකාරියට අදාලව ප්‍රඥප්තිය අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කර නොතිබුණි.	2018 අංක 03 දරණ මධ්‍යම පළාත් මාර්ගයන්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 111 කොටසෙහි 16 වගන්තිය ප්‍රකාරව ප්‍රකාරව අධිකාරියේ සියළු ආයතන හා මුදල් පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය සේවයට පොදුවේ බලපානු ලබන ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි හා මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට අනුකූලව ද තත් කාලයේ බල පැවැත්වෙන නීතිරීති,රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව සිදු කරන අතර, මධ්‍යම පළාත් සභාව පිහිටුවීමෙන් පසු ප්‍රඥප්තිය අනුව මූල්‍ය හා පරිපාලන නීති පිළියෙල කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරමි.
257	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා නිරීක්ෂණය විය.	මෙම තත්වය නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කර ඇත.
257	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.	හිඟ ණය ශේෂ අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.මෙම අය නොවී පවතින හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළ අඩුමාන ණය වෙන් කිරීමක් ද සිදු කර ඇත.

ඩී. ඒ. ජී. ප්‍රියන්ත
ගණකාධිකාරී
ප්‍රවාහන සේවා අධිකාරිය
මධ්‍යම පළාත

දෙවන කොටස

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 හි පිටු අංකය	කම්ටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු/ වත්මන් තත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග
257	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට tsa.cp.gov.lk නාමය යටතේ වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ.
257	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා මෙන්ම මගී ජනතාව වෙත අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ද අවස්ථාව ලබා දී ඇත.
257	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ලෙස තත්වාගනනය කල මතයක් ලබා දී ඇත.(ඇමුණුම් අංක 01)
257	පළාත් ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	පළාත් ගිණුම් කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීමට අදාලව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වලදී නොවිසඳුන විගණන ඡේද ඉවත් කර ගැනීමට කටයුතු කර ඇති අතර අනෙකුත් ඡේද සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතී.
257	නිළධාරින්ගෙන් රජයට හෝ පළාත් සභාවට සිදු වූ පාඩු පුර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි	එක් නිළධාරියෙකුගේ මු.රෙ.104 පරීක්ෂණයේ නිර්දේශ අනුව අයවීමට තිබූ රු.512,500 ක මුදලින් රු.120,000.00 ක මුදලක් 10745 කුවිතාන්සියෙන් 2024.08.15 දින ගෙවා ඇත.නවදුරටත් අය වීමට ඇති රු.392,500.00 ක මුදල මේ දක්වා නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2026.05.07 දින ප්‍රධාන ලේකම් මගින් නීතිපති වෙත ලිපියක් යොමු කර ඇත.

ඩී. එම්. ප්‍රියදර්ශන
සභාපති
පුළියන්ත ඉස්ලාම් අධ්‍යාපන
මධ්‍යම සභාව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටතේ වන ආයතනයන්හි මෙහෙයුම් අනුකූලතාවය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව ඇඟයීම සඳහා සකස් කර ඇති මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය (MIS) මඟින් ඇඟයීම - 2023 මුදල් වර්ෂය

උක්ත කරුණට අදාළව මධ්‍යම පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වලට අදාළව පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 492හි ඇතුළත් දුර්වලතා මහහරවා ගැනීමට ඒ ඒ ආයතන විසින් සඳහන් කර ඇති ක්‍රියාමාර්ග ගෙන ඇති බව සනාථ කරමි.

ජී.එච්.එම්.ජී. ප්‍රේමසිංහ
ප්‍රධාන ලේකම්
මධ්‍යම පළාත

ජී. එච්. එම්. ජී. ප්‍රේමසිංහ
ප්‍රධාන ලේකම්
මධ්‍යම පළාත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : පීපීසී/එප්/03/පිටිඑස්ජී/මූ.ප්‍ර.වි/2023/79

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2024 මැයි/ දින

ගරුතරුණි,

මහ ප්‍රවාහන සේවා අධිකාරිය,

මධ්‍යම පළාත

මධ්‍යම පළාතේ මහී ප්‍රවාහන සේවා අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්වාගණනය කළ මතය

මධ්‍යම පළාතේ මහී ප්‍රවාහන සේවා අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය හා 2018 අංක 03 දරන මහී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ (මධ්‍යම පළාත) 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.මෙහි ඇතුළත් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ පළාත් සභාවේ අනෙකුත් ආයතනවලින් අනාවරණය වන ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සමඟ සම්පිණ්ඩනය කර පළාත් සභාවේ අරමුදල් පිළිබඳ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරනු ලැබේ. එම විගණකාධිපති වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර යථා කාලයේදි පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම් ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර මධ්‍යම පළාතේ මහී ප්‍රවාහන සේවා අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඩී. අසිත ප්‍රියන්ත
අධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 79 23 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk